# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,010 - 2017 මාර්තු මස 10 වැනි සිකුරාදා - 2017.03.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 452 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 454 |


*සැ. යු.* - (i) ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත 2017 පෙබරවාරි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 පෙබරවාරි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 මාර්තු මස 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 මාර්තු මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


449- B 81150 — 5,403 (2017/03)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය** ඃ

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබූවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පෙ-ාතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙ-වත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලා-වකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩද-ාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෙ-ා්ජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩි-කෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරී-මෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේ-වකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශය

### මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ තනතුර සඳහා පවතින පුරප්පාඩුවට සුදුස්සකු තෝරා ගැනීමට අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ ඊට පෙර ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, තැ. පෙ. 570,73/1, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ'' මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

(*අ*) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2017.03.30 දින වේ.

***සටහන***.-ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත වැඩිම ලකුණු ලබා ගත් නිලධාරීන් අතුරින් සුදුස්සකු තෝරා ගනු ඇත.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(අ) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1877/27 දරන 2014.08.28 වන දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථා සංග්‍රහයට හා වරින්වර කරනු ලබන සංශෝධනයන්හි සඳහන් නියමයන් හා කොන්දේසිවලට ද මෙම තනතුර යටත් ය.

03. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2016, රු. 47,615/- 10 x 1,335 - 8 x 1,630- 17 x 2,170-රු. 110,895 ක වැටුප් පරිමාණය හිමි අතර, එහි 20 වන වැටුප් පියවරෙහි පිහිටුවා එම චක්‍රලේඛයේ උපලේඛන 11 හි විධිවිධාන අනුව පත්වීම් දින සිට වැටුප් ගෙවනු ලැබේ.

04. *සුදුසුකම්* :

(4.1) අධ්‍යාපන සුදුසුකම් :-

(*අ*) පිළිගත් විශ්වවිද්‍යාලයකින් භෞතික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය ලබා තිබීම;

සහ

(*ආ*) මිනුම් විද්‍යාව (Metrology or Measurement Science) උපකරණ නිර්මාණ විද්‍යාව (Instrumentation science), භෞතික රාශීන් මැනීම (Measuring of physical Quantities), කාර්මික ස්වයංක්‍රීයකරණය (Industrial Automation), ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව (Applied Electronics), ඉලෙක්ට්‍රොනික හා උපකරණ නිර්මාණ විද්‍යාව, (Electronics and Instrumentation), ව්‍යවහාරික මිනුම් විද්‍යාව (Applied Metrology or Measure-ment Science), ව්‍යවහාරික භෞතික විද්‍යාව (Applied Physics), උසස් ප්‍රකාශ තාක්ෂණය (Advanced Optical Technology) ෆෝටොනික විද්‍යාව (Photonics), සංවේදක ජාල (Sensor Network) මිනුම් තාක්ෂණය (Measurement Technology), යාන්ත්‍රික ඉලෙක්ට්‍රෝනික් විද්‍යාව (Mechatronics), යන එක් ක්ෂේත්‍රයකට අදාළ පිළිගත් විශ්වවිද්‍යාලයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

(4.2) සේවා සුදුසුකම් :-

(*අ*) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියකු වීම.

(*ආ*) තනතුරට බඳවා ගන්නා දිනට පූර්වාසන්නතම වසර පහ (5) තුළ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(*ඇ*) අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව තනතුරට බඳවා ගන්නා දිනට පෙරාතුව වසර හත (07) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

05. *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

06. *වෙනත් සුදුසුකම්* :

(*අ*) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

(*ආ*) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(*ඇ*) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

07. *පොදු කොන්දේසි* :

මේ දක්වා නිකුත් කර ඇති හා කලින්කලට නිකුත් කරනු ලබන රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති රාජ්‍ය සේවය සම්බන්ධයෙන් අදාළ වන සියලුම චක්‍රලේඛ හා

අමාත්‍ය මණ්ඩලයේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියට අදළ වූ බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදළ වේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

චින්තක එස්. ලොකුහෙට්ටි,
ලේකම්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය.

2017 මාර්තු මස 2 වැනි දින.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ 1 ශ්‍රේණියේ මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත්‍රය***

| අංකය ：<br>(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා) |
|---|

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :——.
මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :———.
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

04. දුරකථන අංකය :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

07. උපන් දිනය :————.

08. විවාහක/අවිවාහක බව :————.

09. දැනට සේවය කරන රජයේ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

10. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ දැනට දරන තනතුර සහ ශ්‍රේණිය :————.

11. රජයේ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක,
(අ) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ තනතුරකට ප්‍රථමවරට පත්වූ දිනය :————.
(ආ) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ තනතුරකට පත්වූ දිනය :————.

12. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 04 ඡේදයට අනුව සපුරා ඇති අධ්‍යාපන සුදුසුකම් :————.

13. අධ්‍යාපන සුදුසුකම් :-
(අ) (i) භෞතික විද්‍යාව (විශේෂ) උපාධිය වලංගු වන දිනය :————.
විශ්වවිද්‍යාලය/ආයතනය :————.
බාහිර/අභ්‍යන්තර :————.
හදරන ලද විෂයයන් :————.
(iii) පශ්චාත් උපාධිය :————.
වලංගු දිනය :————.
විශ්වවිද්‍යාලය/ආයතනය :————.
(ආ) වෙනත් උපාධි/පශ්චාත් උපාධි :————.
වලංගු දිනය :————.
විශ්වවිද්‍යාලය/ආයතනය :————.

*අයදුම්කරුගේ සහතිකය*

.................... වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මම රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වන ලද අයෙකු නොවන බවත්, තනතුර අතහැර ගිය අයෙකුසේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සකු කිරීමට යටත් වන බවත් තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දි ගෙවීමකින් තොරව සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරුවන් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

....................................මහතා/මෙනෙවිය/මිය/දැනට/ ............ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ................. වශයෙන් සේවය කරන බවත්, ඔහු/ඇය විසින් ඉහත 9, 10, 11 මගින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහුට/ඇයට විරුද්ධව විනය කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් හෝ විනය පරීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතින/නොපවතින බවත්, ඔහු/ඇය අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව පූර්වාසන්න වසර 05 තුළ සතුටුදයක හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇති/නැති බවත්, නියමිත වැටුප් වර්ධක 05 උපයාගෙන ඇති/නැති, බවත්, වැටුප් රහිත හෝ අඩ වැටුප් සහිත නිවාඩු ලබාගෙන ඇති/නැතිබවත්, ඇයගේ/ඔහුගේ රාජකාරි, පැමිණීම හැසිරීම, කාර්ය සාධනය, සතුටුදයක/අසතුටුදයක බවත් සහතික කරමි.

............මහතා/මෙනෙවිය/මිය මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු සහිතව/රහිතව සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවද දන්වමි.

————,
අමාත්‍යාංශ ලේකම්/දෙපාර්මේන්තු,
ප්‍රධානියා අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

03-805

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බීට්ටු වන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016 (2017)**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, පුරප්පාඩු වී ඇති බීට්ටු වන නිලධාරි තනතුරුවලට පත් කිරීම පිණිස සුදුස්සන් තෝරා ගැනීම සඳහා පැවැත්වීමට නියමිත විවෘත තරග විභාගය සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් 2017.03.31 දිනට අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *වැටුප් ක්‍රමය :*

I. වැටුප් පරිමාණය :-
MN -1 - 2016 රා.ප.ච.ලේඛ 03/2016 අනුව

රු. 27,140-10x300-11x350-10x495-10×660-රු. 45,540.

02. *සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි.* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) පත්වීම අවු. 03ක පරිවාස කාලයකට යටත් වේ.

(iii) බීට්ටු වන නිලධාරින්ගේ සේවා ස්ථාන දිවයිනේ වනගත ප්‍රදේශවල පිහිටි, දුෂ්කර සේවා ස්ථාන වන අතර, වන අපරාධ පිළිබඳ පරීක්ෂාකාරි වීම, වරදකරුවන් අත්අඩංගුවට ගැනීම හා නීතිමය කාර්යයන් සඳහා සහාය වීම යනාදී රාජකාරි ඉටු කිරීම පිණිස තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ නියෝග කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

(iv) *ගැසට් පත්‍රයේ* (2) ඡේදයේ පළ කර ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීමේ දී අදාළවන පොදු කොන්දේසි අදාළ වේ.

(v) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

03. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගන්නා 2017.03.31 දිනට වයස අවු.18ට නොඅඩු අවු. 30ට නොවැඩි විය යුතු ය.

04. 4.1. *අධ්‍යාපන සුදුසුකම්* :
සෑම අයදුම්කරුවකුම පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණ කර තිබිය යුතු ය.

(i) අ.පො.ස.(සා/පෙළ) විභාගයේ දී එක් වරක දී සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා විද්‍යාව ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව, විෂයයන් හයකින් සමත්ව තිබීම.

(ii) අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

4.2. වෘත්තීය සුදුසුකම් :

(i) ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

4.3. කායික සුදුසුකම් :

(i) පිරිමි අයදුම්කරුවන් අවම උස අඩි 5 අඟල් 2ක් හා පපුව අඟල් 32 ක් විය යුතු ය.

(ii) කාන්තා අයදුම්කරුවන් සඳහා අවම උස අඩි 5 ක් විය යුතු ය.

(iii) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

4.4. වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

(i) ලිඛිත තරග විභාගයකින් අයදුම්කරුවන් ලබාගන්නා ලකුණු අනුව, ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින් බඳවා ගැනීමට අනුමත කර ඇති සංඛ්‍යාව මෙන් දෙගුණයක සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, ඒ අනුව ඒකාබද්ධ ඉහළම ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙලින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

(ii) අපේක්ෂකයින් මෙම ප්‍රශ්නපත්‍ර දෙකටම පෙනී සිටිය යුත්තේ එකම භාෂා මාධ්‍යයෙනි. ලිඛිත තරග විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් යුක්තය. සමත් වීම සඳහා ඔබ විසින්

එක් එක් විෂයයක් සඳහා අවම වශයෙන් ලකුණු ප්‍රමාණය 40%ක් වත් ලබාගත යුතු ය.

| | |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | කාලය පැය 01, ලකුණු සංඛ්‍යාව 100 |
| | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, විශ්ලේෂණ තත්ත්වයත්, තීරණ ගැනීමේ හැකියාවත්, විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 50කින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි. (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.) |
| තාක්ෂණය | කාලය පැය 02, ලකුණු සංඛ්‍යාව 100 |
| | අර්ධ ව්‍යුහගත හා ව්‍යුහගත ප්‍රශ්නවලින් යුක්ත ය.<br>* වන සම්පත සහ එහි ජීවීන්ගේ පැවැත්ම කෙරෙහි දේශගුණික හා කාලගුණික තත්වයන් බලපානු ලබන ආකාරය පිළිබඳ අවබෝධය<br>* ශ්‍රී ලංකාවේ පාරිසරික තත්වයන්, භූගෝලීය වැදගත්කම් හා ස්වාභාවික ආපදාවන් පිළිබඳ අවබෝධය<br>* ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික හා නවීන කෘෂිකර්ම ආර්ථිකය කෙරෙහි වූ දැනුම<br>* පරිසර අමාත්‍යාංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, සම්බන්ධ වැදගත් තොරතුරු, එහි කාර්යයන් හා පරමාර්ථ පිළිබඳ අවබෝධය<br>* ස්වාභාවික පරිසරය, වනාන්තර හා වෘක්ෂලතා පිළිබඳ දැනුම<br>* වනාන්තර හා මහජනතාව අතර ඇති සමීප සම්බන්ධතාවය පිළිබඳ වැදගත්කමේ අවබෝධය<br>* භූගෝල විද්‍යාව පිළිබඳ මූලික දැනුම (පෘථිවියේ හැඩය, දේශීය හා කලාපීය භූගෝලීය ලක්ෂණ හා පිහිටීම් ආදිය පිළිබඳ දැනුම, සාමාන්‍ය දැනුම මැන බැලීම) |

06. *අයදුම්පත් හා අනෙකුත් විස්තර* :

(i) මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව, අයදුම් පත්‍රයේ අංක 01 සිට 08 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවට ද, ඉතිරිය ඊළඟ පිටුවලට ද ඇතුළත් වන පරිදි සෙ.මී. 21x29 (ඒ 4 ප්‍රමාණයේ) කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ඉල්ලුම්පත සකස් කළ යුතු අතර, අයදුම්පත්‍රය විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන මාධ්‍යයෙන් තම අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ, ''බීට්ටු වන නිලධාරී තනතුරට බඳවා ගැනීම (විවෘත) - 2016'' යනුවෙන් සඳහන් කර 2017.03.31 දින හෝ ඊට පෙර ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (පෞද්ගලික නමකට හෝ වෙනත් කිසිදු ලිපිනයකට හෝ නොඑවිය යුතු ය.) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) අසම්පූර්ණ හෝ ප්‍රමාදවී හෝ ලැබෙන ඉල්ලුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) තැපෑලේ දී අස්ථාන ගතවන ඉල්ලුම්පත් පිළිබඳව වග කියනු නොලැබේ.

(iv) රජයේ සේවයේ අනුයුක්ත නිලධාරීන් ස්වකීය ඉල්ලුම්පත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, සුදුස්සකු වශයෙන් තේරී පත්වුවහොත් එම දෙපාර්තමේන්තුවෙන් නිදහස් කිරීමට එකඟ වන බවට සඳහන් කළ යුතු ය.

(v) මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vi) ඉල්ලුම්පත ලද බව දන්වනු නොලැබේ.

07. *විභාග ගාස්තු* :

(I) විභාග ගාස්තුව රු. 600.00 කි. එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රාජ්‍ය ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් හෝ උප තැපැල් කාර්යාලයකට ඉහත මුදල් ගෙවා ලබාගත් මුදල් බාර ගැනීමේ කුවිතාන්සිය / ලදුපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. විභාග ගාස්තුව අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනය වන 2017.03.31 දිනට පෙර ගෙවිය යුතු ය. (එම කුවිතාන්සියේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම සුදුසුය.)

(II) කුමන කරුණක් යටතේ වුව ද විභාග ගාස්තුව ආපසු නොගෙවන අතර වෙනත් කිසිම විභාගයක් සඳහා මාරු කිරීමට හෝ ඉඩදෙනු නොලැබේ.

08. පහත සඳහන් ලිපි ලේඛනවලින් එකක් හෝ සියල්ලම හෝ කැඳවීම් කළ අවස්ථාවක ඉදිරිපත් කළ යුතු ය :

(i) උප්පැන්න සහතිකය,

(ii) අධ්‍යාපන සහතික,

(iii) මෑතකදී ලබාගත් ග්‍රාම සේවක සහතිකයක් (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව

(iv) චරිත සහතික දෙකක්,

(v) වෙනත් අදාළ සහතික.

*සැළකිය යුතුයි.-* ලියකියවිලි/සහතික හෝ ඒවායේ පිටපත් ඉල්ලුම් පත්‍රය සමඟ එවීම නොකළ යුතුයි.

09. විභාග මධ්‍යස්ථාන හා ප්‍රවේශපත්‍ර -

(I) විභාගය මෙහි උපලේඛනය- 1හි දැක්වෙන නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පැවැත්වේ. අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර හා ඊට අදාළ අංක අයදුම්පත්‍රයේ ශීර්ෂයේ පළමු හා දෙවෙනි තේරීම වශයෙන් සඳහන් කළ යුතු ය. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම්, එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ඇත. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

(II) නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාල ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙක් නම් එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(III) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු අතර, විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම, තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(IV) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(V) ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයට ලකුණු 40% කට නොඅඩුව ලබාගන්නා අපේක්ෂකයින් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. ලිඛිත හා ව්‍යුහගත පරීක්ෂණවල ලබාගන්නා මුළු ලකුණු ප්‍රමුඛතාව මත සකස් කළ ප්‍රතිඵල ලේඛනය වන සංරක්ෂණ ජනරාල් වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ www.reults.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

10. *අපේක්ෂකයාගේ අනන්‍යතාව* :

විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛනවලින් පමණක් ඕනෑම එකක් පිළිගනු ඇත. :-

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

11. අයදුම්පත්‍රයේ ද, විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද, අයඳුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයඳුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවාද,එසේ නොවන අයඳුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු/විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත්

රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරණ අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

12. අවශ්‍ය අවස්ථාවක දී, මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව, වන සංරක්ෂක ජනරාල් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. සිංහල,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කළ යුතුවේ.

එස්. ඒ. අනුර සතුරුසිංහ,
වන සංරක්ෂක ජනරාල්.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බීට්ටු වන නිළධාරී තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016 (2017)**

WRITTEN COMPITITIVE EXAMINATION FOR RECRUITMENT TO THE POST OF
BEAT FOREST OFFICER (OPEN) - 2016 (2017)

විභාගයට පෙනී සිටින නගරය :

| | නගරය | නගර අංකය |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

(උපලේඛනය - 1 අනුව සම්පූර්ණ කරන්න)

01. විභාගයට පෙනී සිටින මාධ්‍යය ☐
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා. GUNAWARDHANA. M.G.B.S.K.)

(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. (i) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

(ii) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

04. ස්ත්‍රී/ පුරුෂ භාවය ：
  පුරුෂ - 0
  ස්ත්‍රී - 1
  (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය ：

06. (I) උපන් දිනය ： අවුරුද්ද මාසය දිනය

(II) 2017.03.31 වැනි දිනට වයස ： අවුරුදු මාස දින

07. පුරවැසිභාවය ：

  පරම්පරාවෙන් - 1
  ලියාපදිංචිවීමෙන් - 2
  (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. දුරකතන අංකය ：

09. ශාරීරික යෝග්‍යතාවය ：

  1. උස ............

  2. පපුව ： අඟල්............ (කාන්තා අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.)

10. අධ්‍යාපන සුදුසුකම් ：

  (I) *අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය ：*

1 වන වර
වර්ෂය ：......................
විභාග අංකය ：............

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

2 වන වර
වර්ෂය ：.....................
විභාග අංකය ：...........

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

(II) *අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :*

*1 වන වර*
වර්ෂය :......................
විභාග අංකය :............

*2 වන වර*
වර්ෂය :....................
විභාග අංකය :..........

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |

(III) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :————.

11. වෘත්තීය/ වෙනත් සුදුසුකම් :————.

12. I. විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය :————.

II. ලදුපත් අංකය හා දිනය :————.

කුවිතාන්සිය නොගැලවෙන පරිදි මෙහි අලවන්න

13. I. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේ ද?
ඔව්/නැත

II. ''ඔව්'' නම් විස්තර සඳහන් කරන්න :————.

14. ඔබ දැනට රැකියාවක් කරන්නේ නම්, ඒ පිළිබඳ විස්තර :
(I) ආයතනය :————.
(II) මුල් පත්වීම් දිනය :————.
(III) තනතුර :————.
(IV) වැටුප :————.

15. ඔබ ගැන තොරතුරු සැපයිය හැකි ඥාතීන් නොවන දෙදෙනකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න. :

(I) ————.

(II) ————.

16. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය බවට ද, නිවැරදි බවට ද මම සහතික කරමි. මෙහි ඇතුළත් වූ තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව හෝ මා තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගු වීමට යටත් බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

17. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන ...................................................... මහතා / මහත්මිය / මෙනවිය / මා පෞද්ගලිකව දන්නා බව ද, ඔහු /ඇය මා ඉදිරිපිටදී 2017 .................. වැනි දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

_________,
සහතික කරන අයගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම ඃ............................
තනතුර ඃ .........................................
ලිපිනය ඃ .........................................
දිනය ඃ .........................................
(නිල මුද්‍රාව තබන්න)

18. අයදුම්කරු රජයේ සේවකයකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මෙම කොටස සම්පූර්ණ කළ යුතුය. ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ ........................ ලෙස ස්ථිර/තාවකාලික තනතුරක් ලබන බවත් ඔහු/ඇය සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරෙන් මුදාහැරීමට හැකි/නොහැකි බව ද මෙයින් දන්වා සිටිමි.

_________,
දෙපාර්තමේන්තු නිලධාරියා හෝ
ඔහු විසින් බලය පැවරූ නිලධාරියාගේ අත්සන.

නම..................................
තනතුර..............................
(මුද්‍රාව තබන්න)
දිනය............................

***සැ.යු.*-ඉල්ලුම් පත්‍රය සමග මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය/ලදුපත හැර වෙනත් කිසිදු ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ ඇමිණිය යුතු නැත.**

උපලේඛනය - I

| *නගරය* | *නගර අංක* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වව්නියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොලොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන ක්ෂේත්‍ර සහකාර තනතුරට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගය (විවෘත) - 2016 (2017)

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, වන ක්ෂේත්‍ර සහකාර තනතුරු වලට බඳවා ගැනීමට සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් 2017.03.31 දිනට අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *වැටුප් ක්‍රමය* :
PL-2- 2016 රා.ප.ච.ලේඛ 03/2016 අනුව
රු.25,250 -10x270,10x300,10x330,12x350-රු. 38,450.

2. *සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනන්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම අවු. 03ක පරිවාස කාලයකට යටත් වේ.

(iii) වන ක්ෂේත්‍ර කොට්ඨාසයට අයත් සියලුම වනාන්තර ආරක්ෂා කිරීම සඳහා බීට්ටු වන නිලධාරීන්ගේ සහය අඩවි වන නිලධාරිවරයාගේ අධීක්ෂණය යටතේ වැඩපිළිවෙලක් සැළසුම් කර ක්‍රියාත්මක කිරීම, වන අපරාධ පිළිබඳව පරීක්ෂාකාරී වීම, වරදකරුවන් අත්අඩංගුවට ගැනීම සහ අදාළ නීතිමය කටයුතු කිරීම සඳහා සහය වීම වන ක්ෂේත්‍ර සහකාරවරුන්ගේ කාර්යභාරය වේ.

(iv) විශේෂයෙන් තෝරාගනු ලබන අයදුම්කරුවන්ට වනාන්තර ආරක්ෂා කිරීම,වන අපරාධ පිළිබඳව පරීක්ෂා කිරීම, වන අපරාධකරුවන් හා වනජ ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම හා උසාවියට ඉදිරිපත් කිරීම ආදී දුෂ්කර හා අවදානම් රාජකාරී සඳහා ඉහල නිලධාරීන්ට සහාය ලබාදීමට සිදුවේ.බොහෝවිට රජයේ නිවාඩු දිනවල සහ රාත්‍රී කාලයේදී පවා මෙවැනි කටයුතුවල පෞද්ගලිකවම යෙදීමට මෙම නිලධාරීන්ට සිදුවේ. ඉහත සඳහන් පරිදි වන ක්ෂේත්‍ර සහකාරවරුන්ගේ රාජකාරිවල දුෂ්කර සහ අවදානම් සහගත බව නිසා කාන්තාවන්ට එම කටයුතුවල යෙදීම ප්‍රායෝගිකව අපහසු විය හැක.

(v) *ගැසට්* පත්‍රයේ (2) ඡේදයේ පළ කර ඇති රාජ්‍ය සේවයේ තනතුරු වලට පත් කිරීමේ දී අදාළ වන පොදු කොන්දේසි අදාළ වේ.

(vi) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

3. *වයස් සීමාව.* - ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

4. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.*- සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය.

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06ක් සමත්ව තිබිය යුතුයි.

(ii) තනතුරට අදාළ වන පරිදි තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි අවම වශයෙන් දෙවන මට්ටමේ (NVQ - 2) නිපුණතාවයක් ලබා තිබීම.

(iii) පිරිමි අයදුම්කරුවන්ගේ උස අඩි 5 යි අඟල් 02 ට නොඅඩු හා පපුව අඟල් 32ට නොඅඩු විය යුතුය.

(iv) කාන්තා අයදුම්කරුවන්ගේ අවම උස අඩි 05ක් විය යුතුය.

(v) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක ඕනෑම තත්වයක් යටතේ සේවය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(vi) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

5. *බඳවා ගැනීමේ ක්‍රමය* :

(i) ඉහත 4 ඡේදය යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන්, ලිඛිත පරීක්ෂණයකින් එක් එක් විෂයයට ලබා ගත යුතු අවම ලකුණු සීමාව 40% කි. එම සමත් ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල මත, බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් දෙගුණයක සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට ලක් කර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී හා විභාගයේදී ලබා ගන්නා ලද මුළු ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල මත, පවත්නා පුරප්පාඩු 105 සඳහා අනුරූපී ලෙස බඳවා ගනු ලැබේ. විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් සියලු දෙනා වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම් දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා හෝ සිදු කෙරෙනු ඇත.

(ii) ඉහත 5.1 ඡේදයේ සඳහන් පරිදි, බඳවා ගැනීමට පවත්නා අවසන් පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමේ දී සමාන ලකුණු ලැබූ අයදුම්කරුවන් කීප දෙනෙක් සිටියහොත්, එයට ඉහළ ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන් පමණක් බඳවා ගනු ලැබේ.

(iii) ඉහත 5.1 යටතේ සුදුසුකම් මත තෝරාගනු ලබන අපේක්ෂකයින් වසර 03ක් ඇතුලත වෘක්ෂ විද්‍යා පරීක්ෂණයට (ප්‍රාරම්භක මට්ටම) පෙනී සිට සමත් වීමෙන් පසුව හා වසර 03ක සතුටුදායක සේවා කාලයකින් පසුව සේවයේ ස්ථිර කරනු ලැබේ.

6. **විෂය නිර්දේශය :**

ලිඛිත තරග විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් යුක්තය.

(i) අපේක්ෂකයින් මෙම ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු ප්‍රමාණය 40% වත් ලබා ගත යුතුය.

විෂය අංකය

| | | |
|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | කාලය පැය 01, ලකුණු සංඛ්‍යාව 100 |
| | | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, විශ්ලේෂණ තත්ත්වයත්, තීරණ ගැනීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 02 | තාක්ෂණික පරීක්ෂණය | කාලය පැය 02, ලකුණු සංඛ්‍යාව 100 |
| | | වන සම්පත හා එය ජීවීන්ගේ පැවැත්ම සඳහා බලපානු ලබන ආකාරයන් පිළිබඳ අවබෝධය, ශ්‍රී ලංකාවේ පාරිසරික දැනුවත් බව, භූගෝලීය වැදගත්කම පිළිබඳ අවබෝධය, ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ආර්ථිකය පිළිබඳ වූ දැනුම, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධ වැදගත් තොරතුරු, එහි කාර්යයන් හා පරමාර්ථ පිළිබඳ අවබෝධය, ස්වාභාවික පරිසරය, වනාන්තර හා වෘක්ෂලතා පිළිබඳ දැනුම, වනාන්තර හා මහජනතාව අතර ඇති සමීප සම්බන්ධතාව පිළිබඳ වැදගත්කමේ අවබෝධය, භූගෝල විද්‍යාව පිළිබඳ මූලික අවබෝධය (පෘථිවියේ හැඩය, භූලක්ෂණ ආදිය) හා අයදුම්කරුවන්ගේ සාමාන්‍ය දැනුම පිළිබඳ මැන බැලීම. (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.) |

7. *අයදුම්පත් හා අනෙකුත් විස්තර :*

(i) මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව, අයදුම් පත්‍රයේ අංක 01 සිට 08 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවටද, ඉතිරිය ඊළග පිටු වලටද ඇතුලත් වන පරිදි සෙ.මී. 21x29 (ඒ 4 ප්‍රමාණයේ) කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ඉල්ලුම්පත සකස් කළ යුතු අතර, අයදුම්පත්‍රය විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන මාධ්‍යයෙන් තම අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ, 'වන ක්ෂේත්‍ර සහකාර තනතුරට බඳවා ගැනීම (විවෘත) - 2016(2017)' යනුවෙන් සඳහන් කර 2017.03.31 දින හෝ ඊට පෙර ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (පෞද්ගලික නමකට හෝ වෙනත් කිසිදු ලිපිනයකට හෝ නොඑවිය යුතුය.) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත්වනු ඇත.

(ii) අසම්පූර්ණ හෝ ප්‍රමාදවී හෝ ලැබෙන ඉල්ලුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) තැපෑලේදී අස්ථාන ගතවන ඉල්ලුම්පත් පිළිබඳව වග කියනු නොලැබේ.

(iv) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවාද, එසේ නොවන අයදුම් කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු/ විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

(v) මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකුල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vi) රජයේ සේවයේ අනුයුක්ත නිලධාරීන් ස්වකීය ඉල්ලුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර සුදුසසකු වශයෙන් තේරී පත්වුවහොත් එම දෙපාර්තමේන්තුවෙන් නිදහස් කිරීමට එකග වන බවට සඳහන් කළ යුතු ය.

(vii) ඉල්ලුම්පත ලද බව දන්වනු නොලැබේ.

8. *විභාග ගාස්තු :*

(i) විභාග ගාස්තුව රු. 600.00 කි. එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රාජ්‍ය ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් හෝ උප තැපැල් කාර්යාලයකට ඉහත මුදල් ගෙවා ලබාගත් මුදල් බාර ගැනීමේ කුවිතාන්සිය / ලදුපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. විභාග ගාස්තුව අයදුම්පත් කැඳවනු ලබන අවසාන දින වන 2017.03.31 දිනට පෙර ගෙවිය යුතු ය. (එම කුවිතාන්සියේ ඡායා පිටපතක් අයදුම්කරු ළග තබා ගැනීම සුදුසුය.)

(ii) කුමන කරුණක් යටතේ වුවද විභාග ගාස්තුව ආපසු නොගෙවන අතර වෙනත් කිසිම විභාගයක් සඳහා මාරු කිරීමට හෝ ඉඩදෙනු නොලැබේ.

9. පහත සඳහන් ලිපි ලේඛනවලින් එකක් හෝ සියල්ලම හෝ කැඳවීමක් කළ අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) මෑතකදී ලබා ගත් ග්‍රාම සේවා සහතිකයක් (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත);
(iv) චරිත සහතික දෙකක්;
(v) වෙනත් අදාළ සහතික.

*සැළකිය යුතුයි.*-ලියකියවිලි / සහතික හෝ ඒවායේ පිටපත් ඉල්ලුම් පත්‍රය සමග එවීම නොකළ යුතුයි.

10. *විභාග මධ්‍යස්ථාන හා ප්‍රවේශපත්‍ර* :

(i) විභාගය මෙහි උපලේඛනය- 1හි දැක්වෙන නගරවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පැවැත්වේ. අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර හා ඊට අදාළ අංක අයදුම්පත්‍රයේ ශීර්ෂයේ පළමු හා දෙවෙනි තේරීම වශයෙන් සඳහන් කළ යුතුය. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ඇත. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් විභාගය කොළඹදී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

(ii) නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ අයදුම්පත් භාර ගන්නා දින වන 2017.03.31 දින හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම අයදුම්කරුගේ සම්පූර්ණ නම ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙක් නම් එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු අතර, විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම, තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(iv) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

11. *අපේක්ෂකයාගේ අනන්‍යතාව* - විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඉල්ලුම්කරු තම අනන්‍යතාව ඔප්පු කළ යුතු අතර, ඒ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* - තෝරා ගනු ලැබීමට පෙර හෝ පසු හෝ අපේක්ෂකයකු අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නැති බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය හෝ තෝරාගැනීම අවලංගු කළ හැකි අතර, අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වෙනස් කර ඇති බව හෝ ඔහුව තෝරා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් ඔහු රාජ්‍ය සේවයෙන් පහ කිරීමට යටත් වනු ඇත.

13. අවශ්‍ය අවස්ථාවකදී, මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව වන සංරක්ෂක ජනරාල් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කළ යුතුවේ.

එස්. ඒ. අනුර සතුරුසිංහ,
වන සංරක්ෂක ජනරාල්.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන ක්ෂේත්‍ර සහකාර තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය (විවෘත) - 2016 (2017)*

WRITTEN COMPITITIVE EXAMINATION FOR RECRUITMENT TO THE POST OF FOREST FIELD ASSISTANT (OPEN) - 2016 (2017)

විභාගයට පෙනී සිටින නගරය :

| | නගරය | නගර අංකය |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

(උපලේඛනය - 1 අනුව සම්පූර්ණ කරන්න)

01. විභාගයට පෙනී සිටින මාධ්‍යය : ☐
    සිංහල - 2
    දෙමළ - 3
    ඉංග්‍රීසි - 4
    (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
    (*උදා.* GUNAWARDHANA. M.G.B.S.K.)

    (ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

    (iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. (i) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
    (ii) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

04. ස්ත්‍රී/ පුරුෂ භාවය : ☐
    පුරුෂ - 0
    ස්ත්‍රී - 1
    (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

06. (i) උපන් දිනය : අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

    (ii) 2017.03.31 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

07. පුරවැසි භාවය : ☐

පරම්පරාවෙන් - 1
ලියාපදිංචි වීමෙන් - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

09. ශාරීරික යෝග්‍යතාවය :

1. උස ...........

2. පපුව : අඟල්............ (කාන්තා අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.)

10. අධ්‍යාපන සුදුසුකම් :

(I) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය

1 වන වර
වර්ෂය......................
විභාග අංකය............

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

2 වන වර
වර්ෂය....................
විභාග අංකය..........

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

(II) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :————.

11. වෘත්තීය/ වෙනත් සුදුසුකම් :————.

12. I. විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය :————.

II. ලදුපත් අංකය හා දිනය :————.

කුවිතාන්සිය නොගැලවෙන පරිදි මෙහි අලවන්න

13. I. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේ ද?
ඔව්/නැත

II. ඔව් නම් විස්තර සඳහන් කරන්න :————.

14. ඔබ දැනට රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :

(i) ආයතනය :————. (iii) තනතුර :————.

(ii) මුල් පත්වීම් දිනය :————. (iv) වැටුප :————.

15. ඔබ ගැන තොරතුරු සැපයිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න.

(i) ————.

(ii) ————.

16. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම අයදුම්පතේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය බවට ද, නිවැරදි බවටද මම සහතික කරමි.මෙහි ඇතුළත් වූ තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව හෝ මා තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගුවීමට යටත් බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන
(අත්සන සහතික කරන්නා ඉදිරියේ දී අත්සන යෙදිය යුතු ය.)

දිනය :————.

17. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන ...................................................... මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා බව ද, ඔහු /ඇය මා ඉදිරිපිට දී 2017 .................. වැනි දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ නම :............................
තනතුර : ..........................................
ලිපිනය : ..........................................
දිනය : ..........................................
(නිල මුද්‍රාව තබන්න)

18. *අයදුම්කරු රජයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මෙම කොටස සම්පූර්ණ කළ යුතු ය.*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ ......................... ලෙස ස්ථිර/තාවකාලික තනතුරක් ලබන බවත් ඔහු/ඇය සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුව හොත් මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරෙන් මුදාහැරීමට හැකි / නොහැකි බව ද මෙයින් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු නිලධාරියා හෝ
ඔහු විසින් බලය පැවරූ නිලධාරියාගේ අත්සන

නම..................................
තනතුර..............................
(මුද්‍රාව තබන්න)
දිනය............................

***සැ.යු.***-ඉල්ලුම් පත්‍රය සමඟ මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය / ලදුපත හැර වෙනත් කිසිදු ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ ඇමිණිය යුතු නැත.

උපලේඛනය - I

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක :

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොලොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

03-328

---

**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙහි ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2, ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරි II වන ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2016 (2017)

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙහි ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරී II ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවාගැනීමේ සීමිත තරග විභාගයට සුදුසුකම්ලත් රාජ්‍ය නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙහි ලේකම්වරයා විසින් පවත්වනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙහි ප්‍රතිඵල අනුව, සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරි II වන ශ්‍රේණියේ තනතුරුවලට පත් කිරීමට තෝරා ගනු ඇත.

03. පුරප්පාඩු සංඛ්‍යාව 12 කි. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල ම හෝ නොපිරවීමට අමාත්‍යාංශ ලේකම්ට බලය ඇත. පත්වීම ක්‍රියාත්මක වන දිනය අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ.

04. *වැටුප් පරිමාණය* :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව, මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 34,605 - 10x660 - 11x755-15x930 - රු.63,460 (MN 5-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

(උදා : 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා අදාළ වනුයේ රු. 23,874ක මූලික වැටුපක් හා රු. 6,190 ක ගැළපුම් දීමනාවකි.)

05. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. එසේ වුව ද ඔබ වසරක වැඩබැලීමේ කාලයකට යටත්ය. ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරී II ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් ඇතුළත බඳවාගැනීම් පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව, ඔබ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

06. සුදුසුකම්:

06.1 අධ්‍යාපන සුදුසුකම් :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබිය යුතුය. උපාධි ප්‍රතිඵල අපේක්ෂිත පුද්ගලයන්ට අයදුම් කළ නොහැක.

06.2 පළපුරුද්ද :

සේවයේ ස්ථිර කර ඇති ආශ්‍රිත නිලධාරියෙකු හෝ සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරියෙකු වශයෙන් වර්ෂ 05 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, කුඩා ව්‍යාපාර හා ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ දැනුම සහිත නිලධාරියෙකු වීම.

06.3 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

06.4 වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
(iv) තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම්, සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

06.5 වයස් සීමාව : අදාළ නොවේ.

07.

07.1 *බඳවා ගැනීමේ ක්‍රමය*.-ලිඛිත පරීක්ෂණයේ එක් එක් විෂයයට ලකුණු 40% කට නොඅඩුව ලබා ගන්නා අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතා අනුපිළිවෙලට අනුව බඳවා ගැනීම සිදු කෙරේ.

07.2 විභාග ක්‍රමය:

(i) විභාගය කොළඹ දී පමණක් පැවැත්වෙනු ඇත.

(ii) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(iii) අපේක්ෂකයා විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

(iv) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

07.3 විභාගයේ විෂයයන්.-ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. :-

| *විෂයය* | *කාලය* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 01. අවබෝධය | පැය 01 විනාඩි 30 යි | 100 යි | 40% යි |
| 02. බුද්ධි පරීක්ෂණය | පැය 01 යි | 100 යි | 40% යි |

07.4 විෂය නිර්දේශය :

*අවබෝධය* - ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. :

(i) ව්‍යවසායක නිපුණතා ඇති අය හඳුනාගෙන ඔවුන්ව කුඩා ව්‍යාපාර ක්ෂේත්‍රයට යොමු කිරීම,
(ii) කුඩා හා සූක්ෂම ව්‍යාපාර පිළිබඳ අවබෝධය,
(iii) ව්‍යවසායකයින්ට අවශ්‍ය කළමනාකරණ හා අනෙකුත් මූල්‍ය සහ සහය සේවා පිළිබඳ දැනුවත් කිරීම,
(iv) තරුණ තරුණියන් ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයට උනන්දු කිරීම, ඔවුන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම හා පෙළඹවීම් ඇති කිරීම සඳහා අවශ්‍ය වැඩමුළු සංවිධානය කිරීම,
(v) ව්‍යාපාරික තොරතුරු රැස් කිරීම සහ අවශ්‍ය අයට තොරතුරු ලබා දීම.

*බුද්ධි පරීක්ෂණය*.-බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

පදගත, සංඛ්‍යාත්මක හා රූපාකාර සංදර්භ තුළ ඉදිරිපත් කරන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමන හා ප්‍රතිචාර පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ හැකියාව හා බුද්ධිය මැන බැලීම මින් අදහස් කෙරේ.

08.

08.1 විභාග ගාස්තු : විභාග ගාස්තුව රු.1200/-කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට පමණක් ගෙවිය යුතුය. අයදුම්කරුවන් නමින් ලබාගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.(රිසිට්පතේ ඡායා පිටපතක් තමන් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවීමක්, වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් නොකරනු ලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරග නු නොලැබේ.

08.2 විභාග ප්‍රතිඵල :

මෙම නිවේදනයේ 07.3 ඡේදයට අනුව ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතාවය අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත ලබාදෙනු ඇත. ලිඛිත පරීක්ෂණයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව තැපැල් මගින් ලබාදීම හෝ www. results.exams.gov.lk වෙබ් අඩවියෙහි පළකරනු ඇත.

09. *අයදුම්පත්‍ර* : අයදුම්පත්‍රය A 4 (සෙ.මී.22 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(i) අංක 01 - 03 ඡේදයන් පළමුවන පිටුවට ද

(ii) අංක 04 සිට ඉදිරියට එන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වනසේ අයදුම්පත්‍රය පිළියෙළ කර ගත යුතුය.

(iii) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද , දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(iv) අදාළ තොරතුරු තම අත් අකුරින් ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය.

10. විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2017.04.11 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්
සංවිධාන හා විදේශ විභාග ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
තැ.පෙ. 1503
කොළඹ

අයදුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව, "ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරී II වන ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවාගැනීමේ සීමිත තරග විභාගය -2016 (2017)" යනුවෙන් සඳහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලැබේ.

11. *අත්සන සහතික කිරීම* : අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

12.*ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත්කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2 ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අවශ්‍ය අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/ විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබාගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

13. අපේක්ෂකයාගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. :-

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

14. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.-* අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාග යේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර විභාගය පැවැත්වෙද් දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට හැක. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

15. මෙහි සඳහන් නොවන යම් කරුණක් වේතොත්, ඒ සම්බන්ධව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

16. *ගැසට් නිවේදනයේ* සිංහල හා දෙමළ භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල පාඨය බලපැවැත්විය යුතු ය.

එම්.අයි.එම්. රෆීක්
ලේකම්
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙහි ක්ෂේත්‍රගත / කාර්යාලගත බණ්ඩ 2, ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරි II වන ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවාගැනීමේ සීමිත තරග විභාගය - 2016 (2017)***

Limited Competitive Examination for Recruitment to the Post of Entrepreneurship Development Training Officer - Grade II, in Field / Office Category 2 in the Ministry of National Policies and Economic Affairs - 2016 (2017)

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

| | |
|---|---|
| අකුරින් | |
| ඉලක්කමෙන් | |

* රාජකාරි කටයුතු කිරීමේ දී තෝරා ගන්නා භාෂා ක්ෂේත්‍රය

සිංහල - 2
දෙමළ - 3

| | |
|---|---|
| අකුරින් | |
| ඉලක්කමෙන් | |

01.

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(උදා: GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන්) :————.

02.

2.1 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/ දෙමළෙන්)

2.3 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් )

2.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

2.5 ස්ත්‍රී /පුරුෂභාවය : පුරුෂ 0
ස්ත්‍රී 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.6 ජංගම දුරකථන අංකය :————.

03.

3.1 වර්තමාන තනතුර :————.

3.2 එම තනතුරට පත්වූ දිනය :————.

3.3 වර්තමාන තනතුර අයත් සේවය සහ ශ්‍රේණිය :————.

3.4 දෙපාර්තමේන්තුව/ආයතනය :————.

04.

4.1 උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

4.2 2017.04.11 දිනට වයස :

වර්ෂ : මාස : දින :

4.3 විවාහක/අවිවාහක බව : අවිවාහක 1

විවාහක 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. අධ්‍යාපන සුදුසුකම් :

5.1 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තරය :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.

(ii) විභාග අංකය :————.

(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

06. *උපාධිය පිළිබඳ විස්තරය* :

(i) උපාධිය :————.

(ii) විශ්වවිද්‍යාලය :————.

07. *වෘත්තීය සුදුසුකම්* :

(i) ————.

(ii) ————.

(iii) ————.

08. ඔබ කවරදාක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න ):

ඔව් ☐ නැත ☐

("ඔව්" නම් විස්තර සඳහන් කරන්න)

09. *විභාග ගාස්තු* :

(i) විභාග ගාස්තුව ගෙවන ලද කාර්යාලය : ..................................................

(ii) ලදුපත් අංකය හා දිනය : ..................................................

(iii) ගෙවූ මුදල රු. .......................................

| විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න) |
|---|

10. *අයදුම්කරුගේ ප්‍රකාශය* :

(අ) මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව ද පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කර සිටිමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................ මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිටදී .......................... වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද, සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ...................................................................මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................................... තනතුරක සේවය කරන බව ද, 2016.12.31 දිනට පූර්වයෙන් පස් අවුරුදු කාලසීමාව තුළ(සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීමේ කොන්දේසියක් වන වේතනාධිකය හැර) ඔහුගේ /ඇයගේ වේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද, එම කාල සීමාව තුළ කළ වරදකට/ (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බව ද, *ගැසට්* නිවේදනයේ 06.4 ඡේදය අනුව, අවුරුදු පහක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බව ද, අදාළ *ගැසට්* නිවේදනයෙහි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙම අයදුම්පත්‍රය අත්සන් කළ බව ද මෙයින් සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරෙන් නිදහස් කිරීමට එකඟතාවය පළ කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :————.
සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

***සටහන*** :
රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු, රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

03-423/1

---

**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙහි ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2, ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරි II වන ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016 (2017)

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙහි ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරි II ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගයට සුදුසුකම් ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙහි ලේකම්වරයා විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල අනුව, සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරි II වන ශ්‍රේණියේ තනතුරුවලට පත් කිරීමට තෝරා ගනු ඇත. (ලිඛිත විභාගය සමත් අය අතරින් කුසලතා අනුපිළිවෙලට, බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ.)

03.පුරප්පාඩු සංඛ්‍යාව 49 කි. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල ම හෝ නොපිරවීමට අමාත්‍යාංශ ලේකම්ට බලය ඇත. පත්වීම ක්‍රියාත්මක වන දිනය අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ.

04. *වැටුප් පරිමාණය* :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව, මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 34,605 - 10X660 - 11X755-15X930 - රු.63,460 (MN 5-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. (උදා : 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා අදාළ වනුයේ රු. 23,874 ක මූලික වැටුපක් හා රු. 6,190 ක ගැළපුම් දීමනාවකි.)

05. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරි II ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් ඇතුළත බඳවාගැනීම් පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව, ඔබ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

06. *සුදුසුකම්* :

06.1 අධ්‍යාපන සුදුසුකම් :

ව්‍යවසායකත්වය, ආර්ථික විද්‍යාව, වාණිජ විද්‍යාව, කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, සමාජ විද්‍යාව, සංඛ්‍යානය, තොරතුරු තාක්ෂණය, කෘෂි විද්‍යාව හෝ ව්‍යවසායකත්වය, කළමනාකරණය, ගණකාධිකරණය, ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍ර ආවරණය වන විෂයයන් සහිතව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වර්ෂ හතරක විශේෂ උපාධියක් ලබා තිබිය යුතුය. උපාධි ප්‍රතිඵල අපේක්ෂිත පුද්ගලයන්ට අයදුම් කළ නොහැක.

06.2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

06.3 වෙනත් සුදුසුකම්:

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය;
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය;
(iii) තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම්; සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට්* පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

07. *වයස් සීමාව* : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 1996.04.11 දිනට හෝ ඊට පෙර හා 1982.04.11 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

08.1 බඳවා ගැනීමේ ක්‍රමය: ලිඛිත විභාගය 2017 ජුනි මස කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

08.2 විභාග ක්‍රමය :

(i) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) අපේක්ෂකයා විභාගයේදී පෙනී සිටින සියලු ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(iii) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

08.3 විභාගයේ විෂයයන් : ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| විෂයය | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. අවබෝධය | පැය 01 විනාඩි 30 යි. | 100 යි. | 40% යි. |
| 02. බුද්ධි පරීක්ෂණය | පැය 01 යි. | 100 යි. | 40% යි. |

08.4 විෂයය නිර්දේශය:

අවබෝධය - ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

(i) ජාතික ආර්ථික සංවර්ධනයේ දී කුඩා ව්‍යාපාර සංවර්ධන ක්ෂේත්‍රයේ ඇති වැදගත්කම අවබෝධ කර ගැනීම.
(ii) ජාතික සංවර්ධනයට ගැළපෙන පරිදි ව්‍යාපාරික අවස්ථා හඳුනාගැනීම.
(iii) ප්‍රාදේශීය වශයෙන් පවත්නා සම්පත් සහ ජාතික හා ජාත්‍යන්තර වෙළෙඳපොළ අවස්ථාවන් හඳුනාගෙන ඒ අනුව ව්‍යවසායකයින්ට මග පෙන්වීම.
(iv) ව්‍යවසායක නිපුණතා ඇති අය හඳුනාගෙන ඔවුන්ව කුඩා ව්‍යාපාර ක්ෂේත්‍රයට යොමු කිරීම.
(v) කුඩා හා සූක්ෂම ව්‍යාපාර පිළිබඳ අවබෝධය
(vi) ව්‍යවසායකයින්ට අවශ්‍ය කළමනාකරණ හා අනෙකුත් මූල්‍ය සහ සහය සේවා පිළිබඳ දැනුවත් කිරීම.
(vii) තරුණ තරුණියන් ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයට උනන්දු කිරීම, ඔවුන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම හා පෙළඹවීම් ඇති කිරීම සඳහා අවශ්‍ය වැඩමුළු සංවිධානය කිරීම.

(viii) ව්‍යාපාරික කටයුතුවල දී බැංකු හා මූල්‍ය ආයතනවලට ඉදිරිපත් කිරීමට අවශ්‍ය ව්‍යාපාරික සැලසුම්, ව්‍යාපෘති සකස් කිරීම.

(ix) ව්‍යාපාරික තොරතුරු රැස් කිරීම සහ අවශ්‍ය අයට තොරතුරු ලබා දීම.

බුද්ධි පරීක්ෂණය - බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

පදගත, සංඛ්‍යාත්මක හා රූපාකාර සංදර්භ තුළ ඉදිරිපත් කරන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමන හා ප්‍රතිචාර පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ හැකියාව හා බුද්ධිය මැන බැලීම මින් අදහස් කෙරේ.

08.5. *වෘත්තීය පරීක්ෂණය :*

ලිඛිත විභාගය සමත් අය අතරින් කුසලතා අනුපිළිවෙලට, බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයේදී ම සුදුසුකම් පරීක්ෂා කරනු ලබන අතර එහිදී ලබාදෙන ලකුණු ප්‍රමාණ පහත දැක්වේ.

| | *ලකුණු ප්‍රමාණය* |
|---|---|
| ඉදිරිපත් කිරීමේ කුසලතා | 30 |
| තොරතුරු තාක්ෂණ සාක්ෂරතා පරීක්ෂණය | 20 |
| එකතුව | 50 |

09.

(i) *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 1,200 කි. එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට පමණක් ගෙවිය යුතුය. අයදුම්කරුවන් නමින් ලබා ගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (එහි ඡායා පිටපතක් තමන් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ.

(ii) මෙම නිවේදනයේ 08.3 ඡේදය අනුව ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් 08.5 ඡේදය අනුව වෘත්තීය පරීක්ෂණයකට යොමු කිරීමෙන් අනතුරුව එම පරීක්ෂණ දෙකෙන්ම ලබාගන්නා මුළු ලකුණු කුසලතාවය අනුව අවසන් ප්‍රතිඵල ලේඛනය නිකුත් කරනු ඇත. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත අවසන් ප්‍රතිඵල ලේඛනය ලබාදීමෙන් අනතුරුව ලිඛිත පරීක්ෂණයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල තැපැල් මගින් හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

10.

10.1 *අයදුම්පත්‍ර :* අයදුම්පත්‍රය A 4 (සෙ.මී.22 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(i) අංක 01 - 03 ඡේදයන් පළමුවන පිටුවට ද,

(ii) අංක 04 සිට ඉදිරියට එන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වනසේ අයදුම්පත්‍රය පිළියෙළ කර ගත යුතුය.

(iii) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද , දෙමළ අයදුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(iv) අදාළ තොරතුරු තම අත් අකුරින් ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය.

11. විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2017.04.11 වැනි දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. අයදුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව, "ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරි II වන ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවාගැනීමේ විවෘත තරග විභාගය -2016 (2017)" යනුවෙන් සඳහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503,
කොළඹ.

12. *අත්සන සහතික කිරීම :* අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමින් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගතයුතුය. විභාගය සඳහා පෙනී සිටින දින විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

13. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2 ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අවශ්‍ය අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

14. අපේක්ෂකයාගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්:* අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට හැක. අයදුම්පත්‍රයක් එවා ඇති සෑම අයදුම්කරුවකුටම විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කරනු ලැබේ. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16. මෙහි සඳහන් නොවන යම් කරුණක් වේතොත්, ඒ සම්බන්ධව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

17. *ගැසට්* නිවේදනයේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල පාඨය බලපැවැත්විය යුතුය.

එම්. අයි. එම්. රෆීක්,
ලේකම්,
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය.

ආදර්ශ අයදුම්පත්‍රය

**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙහි ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2, ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරි II වන ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවාගැනීමේ විවෘත තරග විභාගය - 2016 (2017)**

Open Competitive Examination for Recruitment to the Post of Entrepreneurship Development Training Officer - Grade II in Field / Office Category 2 in the Ministry of National Policies and Economic Affairs - 2016 (2017)

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2

දෙමළ - 3

ඉංග්‍රීසි - 4

| | |
|---|---|
| අකුරින් | |
| ඉලක්කමෙන් | |

* රාජකාරි කටයුතු කිරීමේ දී තෝරා ගන්නා භාෂා ක්ෂේත්‍රය :

සිංහල - 2

දෙමළ - 3

| | |
|---|---|
| අකුරින් | |
| ඉලක්කමෙන් | |

01.

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා: GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන්) :————.

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

1.5 ස්ත්‍රී /පුරුෂභාවය : පුරුෂ 0
ස්ත්‍රී 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02.

2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 ජංගම දුරකථන අංකය :————.

03.

3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.

3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

3.3 පදිංචිව සිටින කාල සීමාව :————.

3.4 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

04.

4.1 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

4.2 2017.04.11 දිනට වයස :

වර්ෂ : ☐☐ මාස : ☐☐ දින : ☐☐

4.3 විවාහක/අවිවාහක බව : අවිවාහක 1
විවාහක 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. අධ්‍යාපන සුදුසුකම් :

5.1 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තරය :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.

(ii) විභාග අංකය :————.

(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |

06. උපාධිය පිළිබඳ විස්තරය :

(i) උපාධිය :————.

(ii) විශ්වවිද්‍යාලය :————.

07. වෘත්තීය සුදුසුකම් :

(i) ————.

(ii) ————.

(iii) ————.

08. ඔබ කවරදාක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) :

ඔව් ☐ නැත ☐

("ඔව්" නම් විස්තර සඳහන් කරන්න)

09. විභාග ගාස්තු :

(i) විභාග ගාස්තුව ගෙවන ලද කාර්යාලය :————.

(ii) ලදුපත් අංකය හා දිනය :————.

(iii) ගෙවූ මුදල රු. :————.

| විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න) |
|---|

10. අයදුම්කරුගේ ප්‍රකාශය :

(*අ*) මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(*ආ*) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව ද පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(*ඇ*) තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කර සිටිමි.

(*ඈ*) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................................................... මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී .......................... වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද, සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ
අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

*සටහන* :
රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගතයුතු ය.

03-423/2

---

## නිවැරදි කිරීමයි

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

සමාජ සේවා දෙපාර්තමේන්තුව

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල ස්ථාන භාර නිලධාරි තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්වනු ලබන සීමිත තරග විභාගය - 2017

2017.02.17 වැනි දින අංක 2007 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ස්ථාන භාර නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වූ නිවේදනයේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ''ලකුණු ලබාදිය යුතු ක්ෂේත්‍ර'' යටතේ දක්වා ඇති වගුවෙහි ''04 වන කොටස'' පහත පරිදි නිවැරදි විය යුතු ය.

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | |
|---|---|---|
| 04. පරිගණක හැකියාව<br>(උපරිම සුදුසුකමට පමණක් ලකුණු පිරිනැමේ) | | 05 |
| 1. පත්වීම් බලධරයා විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් පරිගණක පිළිබඳ වසරක හෝ ඊට වැඩි කාලයක් සඳහා වන ඩිප්ලෝමාවක්/සහතිකයක් සඳහා | 05 | |
| 2. පත්වීම් බලධාරියා විසින් පිළිගත් ආයතනයකින් ලබාගත් පරිගණක පිළිබඳ මාස 6ක හෝ ඊට වැඩි කාලයක් සඳහා වන ඩිප්ලෝමාවක්/සහතිකයක් සඳහා | 03 | |

මහින්ද සෙනෙවිරත්න,
ලේකම්,
සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය.

2017 පෙබරවාරි මස 22 වැනි දින,
සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය,
1 වන මහල,
II අදියර,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

03-482

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.